

# යුද බලයෙන් අඩක්ද සමග කරුණා අම්මාන් සංවිධානය හැර යයි

සන්නසට සකස් කරන්නේ ශ්‍රීලාල් සෙනෙවිරත්න

කාන්තාවන් සඳහා වන ප්‍රධාන ලේකම් කාර්යාලය කොළඹත්, එහි උප කාර්යාලය කිලිනොච්චියෙහිත් ස්ථාපිත කළ හැකිය යන අදහස ඉදිරිපත් වූ අවස්ථාවේ එය පිළිගැනීම අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ අතර ඒ පිළිබඳව අපගේ පාර්ශ්වයෙහි යුක්ති සහගත හේතුද ඉදිරිපත් කළෙමු.

''යුද්ධයට සම්බන්ධ දෙපාර්ශ්වයේ කාන්තාවන්ම පීඩාවට පත්වෙලා ඉන්නේ කියන එක ඇත්ත. ඒ වුණත් සංසන්දනය කරලා බලපුවම වැඩිපුර පීඩාවට පත්වෙච්ච අය ඉන්නේ උතුරු නැගෙනහිරනේ. ඒ නිසා වැඩිපුර වැඩකරන්න ඕනෑ මේ ප්‍රදේශවල. ඒ නිසා කාන්තාවන් සඳහා සාම ලේකම් කාර්යාලයේ ප්‍රධාන ලේකම් කාර්යාලය කිලිනොච්චියෙ ස්ථාපිත කරන එක තමයි වඩාත් සුදුසු.'' යන අපේ අදහස අවසානයේ පිළිගත්තේය. එදින සාකච්ඡා අවසානයේ මාධ්‍ය වෙත ඒකාබද්ධ නිවේදනයක් ද නිකුත් කළෙමු.

කිලිනොච්චියේ දී මෙම හමුවීම දෙවතාවක් සිදු කෙරුණි. දෙවෙනි හමුවීමේදී කාන්තාවන් සඳහා වූ සාම ලේකම් කාර්යාලය ක්‍රියාත්මක විය යුත්තේ කෙ සේ ද යන්න පිළිබඳව සැලැසුමක් සකස් කළේය. මෙම ලේකම් කාර්යාලය සඳහා වන මුල්‍ය උපකාරය නෝර්වේ රජය සැපයීමට ඉදිරිපත්ව සිටින බව පැවසූ හෙයින් ඒ සඳහා වන වියදම් ඇස්තමේන්තු වාර්තාවක් ද සකස් කළේය.

ප්‍රධාන සාකච්ඡාවල ආයු කාලය කොයිතරම් පවතී ද යන්න ප්‍රශ්නාර්ථයක්ව පැවැති තත්ත්වයක් තුළ කාන්තාවන් සඳහා වන හමුවීම් අධික ලෙසින් ප්‍රගතියක් ඇති කරනු ඇතැයි යන්න පිළිබඳව ඇත්තෙන්ම මා තුළ විශ්වාසයක් පැවතියේ නැත. එහෙත් දෙමළ කාන්තාවන්ගේ ප්‍රශ්න පිළිබඳව වෙනත් සමාජවලට අයත් කාන්තාවන් සමඟ විවෘත මනසකින් කතා කිරීමට හැකිවීමත්, දේශපාලනයට ඔබ්බෙන් යුද්ධය නිසා කාන්තාවන් මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව සමාන මානසික ආකල්ප සහිත විවිධ පාර්ශ්වයන් සමඟ අදහස් හුවමාරු කර ගැනීමත් ඉතාමත් වෙනස් අත්දැකීමක් විය.

හමුවීම් අවසානයෙහි අප අතරෙහි වූ මතවාදිමය වෙනස්කම්වලට වඩා එකඟතාවන් සහ පුද්ගලික මිත්‍රත්වයක් වර්ධනය වී පවතින බව තේරුම් ගැනීමට හැකිවිය. හමුවීමේ අවසානයෙහි දී අප අතරෙහි පැවැති අදහස් සහ මතවාදීමය වෙනස්කම් කොහේදෝ සැඟව ගියා සේ දැනුණි. සම හැඟීම් ද, පෞද්ගලික මිත්‍රත්වය ද ඉහළට මතුව ඇති බව දැනෙන්නට විය. විශේෂයෙන්ම ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මිය මා සමඟ මහත් ආදරයෙන් සහ මිත්‍රත්ව හැඟීම් පෙරදැරිව ආශ්‍රය කළාය. ලංකා සමාජ විද්‍යා සංගමයෙහි ප්‍රකාශන දිගටම මා වෙත එවා සටන්කාමියෙක් බුද්ධිමතෙක් බවට පත් කිරීමේ ආශාව ඇය තුළ විය.

අනුග්‍රාහක ලෙසින් කටයුතු කළ ඇස්ට්‍රිච් හෙයිබ්බෝර්ග් මැතිනිය ද මහත් සරළ නිරවුල් චින්තනයෙන් යුතුව සියලු දෙනාටම සහභාගි විය හැකි පරිදි එම රැස්වීමට මඟ පෙන්වූවාය. එමෙන්ම කුමාරි ජයවර්ධන මහත්මිය ද අපගේ අත් අල්ලා මිත්‍රත්වයෙන් යුතුවත්, පුළුල් දැක්මක් සහිතවත් සාකච්ඡාවට සහභාගි වී අප සමඟ කටයුතු කළාය. ඇය සමඟ පැමිණ සිටි සියලු දෙනාම එසේ වූහ. එය මට මහත් විශේෂ අත්දැකීමක් විය. පුළුල් චින්තනයන් සහිත කාන්තාවන් එකට එක්වන විට සැබෑ සාමය සහ වෙනස්වීම් සඳහා වන මාර්ග ඉබේම විවෘත වන බව මම මගේ අත්දැකී මෙන් දැන ගත්තෙමි. ප්‍රජාවන් අයත් වන සියලුම සාකච්ඡාවලදී කාන්තාවන් අධික ලෙසින් සහභාගි කරගත හැකිනම් සමාජෙ යහි ප්‍රගතිය ආශ්‍රිත සම්මුති බහුල ලෙසින් ඇතිවීමට අවස්ථා උදාවන්නට තිබිණැයි මම පසු කාලයෙහි සිතුවෙමි. මෙම හමුවීම්වලට පසුව කාන්තාවන් සඳහා වන සාම ලේකම් කාර්යාලයක් කිලිනොච්චියෙහි පිහිටුවීම සඳහා වන මුදල් නෝර්වේ නියෝජිතයන් කිලිනොච්චියේදී අප වෙත භාර දීමට ඉදිරිපත් වූ අවස්ථා වේ එය සාම සාකච්ඡාවලින් ඉවත්වීමේ තීරණය සංවිධානයෙහි නායකත්වය ගෙන තිබූ කාලය විය. එහෙයින් මුදල් භාරගැනීම ප්‍රතික්ෂේප කළ සංවිධානය එම මුදල් ආපසු යැව්වේය.

සාම උත්සාහයන් ආරම්භ කළ කාලයේ සිට සාකච්ඡා බිඳ වට්ටවන ආකාරයේ බොහෝ දේ සිදුවුණත් එවැනි අවස්ථාවන්ගෙන් සාමය ඉතාමත් අසීරුවෙන් පණ බේරා ගෙන සිටියේය. මෙවැනි අවස්ථාවක් සාම සාකච්ඡා ආරම්භ කර දවස් දෙක තුනකින් මම දුටුවෙමි.

සති ගණනක් වන්නියෙහි නතරවී සිටි ඇන්ටන් බාලසිංහම් වැදගත් හමුවීම් කිහිපයක් අවසානයෙහි ලන්ඩනයට පිටත්ව යාමට සූදානම්ව උන්නේය. හෙලිකොප් ටරයෙන් පිටත්වන ඔහුට සමුදීම සඳහා වගකීම් භාර තනතුරු දැරූ බොහෝ දෙනෙක් ඔහුගේ නිවෙසට රැස්ව උන්හ. මමද ඒ අතර උන්නෙමි. ටික වේලාවකින් නායකතුමා වන ප්‍රභාකරන්ද එහි පැමිණි යේය. ඔහු ඇන්ටන් බාලසිංහම් සමඟ සතුටුව කතා කරමින් සිටි අවස්ථාවේ මුහුදු කොටි විශේෂ සෙන්පති සූසෙ මහත් තැතිගත් ස්වාභාවයකින් එහි පැමිණියේය. ඔහු කෙලින්ම නායකතුමා සහ ඇන්ටන් බාලසිංහම් කතාබහ කරමින් සිටි තැනට ගොස් කුමක්දෝ බැරෑරුම්ව පැවසුවේය. මොහොතකින් ඔවුහු මහ හඬින් කතාබහේ යෙදෙන්නට වූහ. මුලතිව් ගැඹුරු මුහුදේ ලංකාවේ නාවික හමුදාවේ ඩෝරා යාත්‍රා දක්නට ලැබෙන බව කොටින්ගේ රේඩාර් මධ්‍යස්ථානය දැනුම් දීමෙන් පසුව මුහුදු කොටින්ගේ ප්‍රහාරක බෝට්ටු සූදානම් කර තත්ත්වය කෙලින්ම නායකතුමා වෙත දන්වා ප්‍රහාරය සඳහා නායකතුමාගේ අනුමැතිය ලබාගැනීමට පැමිණි බවට සූසෙ ප්‍රකාශ කළේය.

මඳ වේලාවක් ඉවසීමෙන් සිටින ලෙසට ඔහුට දැන්වූ ඇන්ටන් බාලසිංහම් සාම මහ ලේකම් කාර්යාලයෙහි අධ්‍යක්ෂකව සිටි පුලිදේවන් වහාම කැඳවා කොළඹ සාම මහලේකම් කාර්යාලය සහ සටන් විරාම නිරීක්ෂණ කමිටුව සමඟ හදිසි ඇමතුම් කිහිපයක් ලබා ගත්තේය. ඔහු අදාළ ස්ථාන සමඟ සාකච්ඡා කර යුද්ධ යාත්‍රාවන්ගේ සංචාරය පාලනය කරන බවට පොරො න්දු වී ඇති බව නායකතුමාට දැනුම් දුන්නේය. පැය කිහිපයක් ගතවන තෙක් එම ස්ථානය පැවතියේ මහත් තැතිගැන්මක් සහිතවය. ලංකාවේ නාවික හමුදාවට අයත් ඩෝරා යාත්‍රාවල සංචාරය පිළිබඳ තොරතුරු සෙන්පති සූසෙ විමසමින් උන්නේය. ඇන්ටන් බාලසිංහම් සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායමේ නායකයා සමඟ දුරකථනයෙන් සම්බන්ධව උන්නේය.

''බාල අය්යේ, දැනුත් ඩෝරා එහෙ මෙහෙ යනවා. වෙරළ කිට්ටුවට ආවොත් අනිවාර්යෙ යන්ම ගහනවා කියලා කියන්ඩ'' යැයි සූසෙ බියවද්දමින් උන්නේය.

''පොඩ්ඩක් ඉවසපන් බන්, සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ නායකයා නාවික හමුදාවේ අණ දෙන නිලධාරියත් එක්ක කතා කරමින් තමයි ඉන්නේ. ඉක්මනින් තීරණය දැනුම් දෙයි.'' යැයි පැවසූ ඇන්ටන් බාලසිංහම් දෙකොන විලක්කුවක් මෙන් උන්නේය.

ටික මොහොතකට පසුව කොටින්ගේ රේඩාර් තිරයෙන් ලංකාවේ නාවික හමුදා ඩෝරා යාත්‍රා නොපෙනී ගිය බවට සූසෙ වෙත දැනුම් දුන්නේය. ඔහුද මුහුදු කොටි ප්‍රහාරක බළඇණිවලට කඳවුරට යන ලෙස අණ කළේය. ඒ වන තෙක් දැඩි පෙණුමකින් යුතුව කල්පනාවෙහි නිමග්නව සිටි නායකතුමා සුපුරුදු සිනහවෙන් සියලු දෙනා සමඟ විහිළු තහළුවෙන් යුතුව කතා බහ කරන්නට වූයේය. සිනමා දර්ශනයක් සේ එහි සියලු දේ බලමින් සිටි සියළු දෙනාට සැනසුම් සුසුමක් හෙළීමට හැකිවිය. තව සුලු මොහොතක පමාවකින් සමහර විට තත්ත්වය උඩු යටිකුරු කිරීමට හේතු වනු ඇත. ප්‍රහාර එල්ල කිරීම සඳහා වන නියෝගය නායකතුමා විසින්ම සෙන්පති සූ සෙ වෙත නිකුත් කිරීමට තිබුණි යන්න සියලු දෙනාම දැන සිටි කරුණක් විය. මක් නිසාද යත් ලංකා දූපතේ යුද්ධය ද සාමය ද යන්න තීරණය කළ හැකි බලගතු නායකයා බවට ප්‍රභාකරන් පත්ව සිටි බැවිනි.

එක පැත්තකින් සාම ක්‍රියාදාමය ඉබි ගමනින් ඉදිරියට යද්දී සංවිධානයේ අභ්‍යන්තර ව්‍යුහයේ බොහෝ වෙනස්කම් ඇති විය. එයින් එක් කොටසක් සංවිධානයේ පිරිස් බලයන් සමඟ සම්බන්ධ වීම විශේෂය. සංවිධානයෙහි මුදුන් මුල වූයේ එහිය. එය ටිකින් ටික සෙළවෙන්නට පටන් ගත්තේය. නැගෙනහිර පළාතේ සෙන්පතිව සිටි කරුණා අම්මාන් තමන්ගේ පාලනය යටතේ සිටි දහස් ගණන් සටන්කාමීන් සමඟ විමුක්ති කොටි සංවිධානයෙන් වෙන්ව යන බව දැනුම් දී තිබුණි. වැඩිපුර බැහැරට නොපෙන්නුවත් මෙය සංවිධානය තුළ මහත් කම්පනයක් ඇති කර තිබුණි. සංවිධානයේ වඩාත් බලගතු සෙන්පති ලෙස ප්‍රමුඛස්ථාන යේ කරුණා අම්මාන් උන්නේය. ඔහු සමඟ අතිශය දක්ෂ සටන්කාමී සාමාජික සාමාජිකා වෝද, මැදි මට්ටමේ සෙන්පතිවරු බොහෝ දෙනෙක් ද උන්හ. වන්නි සටන් පෙරමුණේ බොහෝ ජයග්‍රහණවලදී ඔහු තම දැඩි ශක්තිමත් බවේ මුද්‍රාව සටහන් කළේය. එය කිසිවෙකුටවත් ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි. මෙවන් තත්ත්වයක් තුළ සංවිධා නයේ අර්ධයක පමණ යුදමය බලය කරුණා අම්මාන්ගේ වෙන්ව යෑමත් සමඟ අහිමි විය.

